**සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය - 2018**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයයේ (“ආයතනය”)2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 1971 අංත 38 දරන මුදල් පනතේ විධානයන් යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මධ්‍යස්ථානය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත්කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,

- සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** **මූල්‍ය ප්‍රකාශන**

**අවිධිමත් ගණනය කිරීම් හෝ ඇස්තමේන්තු**

**විගණනය සඳහා සාක්ෂි නොවීම**

| **ගිණුම් අයිතමය** | **වටිනාකම** | **ඉදිරිපත් නොකළ සාක්ෂි** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| | **Rs** | | | |
| **ගොඩනැගිලි හා වැඩිදියුණු කිරීම් ලීබඩු, සවිකිරීම් හා කාර්යාල උපකාරණ** | 530,139,729<br>62,094,152 | ස්ථාවර වත්කම් ලේඛණය , විස්තරාත්මක උපලේඛණ සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තා | විශාල ක්ෂය ප්‍රමාණයක් වෙන්වීම හා ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය නොකිරීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.ප්‍රත්‍යාගණනය සිදුකළේ නම් පොදු සංචිතය වැඩිවීමක් සිදුවේ. ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කරමින් පවතින අතර ප්‍රමාදයට හේතුවූයේ දත්ත ඇතුලත් කිරීම සඳහා පරිගණක පැකේජයේ දෝෂයකි. සමාගම සමග පැවති සාකච්ඡාවකින් පසු වෙනත් මෘදුකාංගයක් මගින් අදාල දත්ත ඇතුලත් කිරිමට සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයට සහය දීමට එකඟ විය. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ගිණුම් ශේෂ තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| **යන්ත්‍රෝපකරණ** | 31,850,145 | | | |
| **ක්‍රීඩා භාණ්ඩ** | 1,876,481 | | | |
| වෙනත් වත්කම් | 5,962,234 | | | |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

**ලැබිය යුතු ගිණුම්**

------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------------------------ | ------------------------------------------ | ------------ |
| ආයතනයේ සේවකයන් තිදෙනෙකුට ලබාදන ලද රු. 134,723 ක ගංවතුර ණය ඇපකරුවන්ගෙන් හෝ අර්ථසාධක අරමුදලෙන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | එම ලැබියයුතු ණය මුදල ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් හෝ අර්ථසාධක අරමුදලෙන් අයකරගැනීමට කටයුතු කරනු ලැබේ. | අයකරගතයුතු ණය මුදල අයකරගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| -------------------------- | -------------------- | --------------------------------- | ----------------- |
| **නීති/ මගපෙන්වීම් වලට යොමුව**<br>------------------------- | **විස්තරය**<br>----------- | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**<br>----------------------- | | | |
| මුදල් රෙගුලාසි 1646 | ආයතනයේ වාහන 05 කට අදාලව මාසික කාර්යසාධන සාරාංශයන් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ වාහන වලට අදාලව මාසික කාර්යසාධන සාරාංශයන් 2019 වර්ෂයේ සිට පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුවේ |
| **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහය**<br>-------------------------- | | | |
| i) පරිච්ඡේදය X වගන්තිය 1.6.1 සහ පරිච්ඡේදය XX වගන්තිය 3 (1) | අධ්‍යන කාර්යමණ්ඩලයේ පැමිණීම හෝ පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත | තමන් පැය 24 පුරාම සේවය කරන බැවින් ඔවුන් පැමිණීම හෝ පිටවුම සටහනු නොකරන බව විශ්වවිද්‍යාල | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන සංග්‍රහයට අනුකූල වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු. 96,615,640 ක් ගෙවා තිබුණි. | ආචාර්යවරුන්ගේ සංගමය දැනුම්දී ඇති අතර විශ්වවිද්‍යාල පාලක සභාව මෙම කාරණය සම්බන්ධයෙන් කිසිදු තීරණයක් ගෙන නොතිබුණි. | |
| ii) පරිච්ඡේදය IX වගන්තිය 4.1 | අතිකාල දීමනා ගෙවීමේදී අතිකාල රාජකාරී සත්‍ය වශයෙන්ම ඉටුකළ බවට විශ්වවිද්‍යාලයේ රෙජිස්ට්‍රාර්වරයා පෞද්ගලිකවම සෑහීමකට පත්විය යුතුය. නමුත් ආයතනය විසින් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය විය. | අතිකාල ලේඛණ වෙන වෙනම පවත්වාගැනීමට කටයුතු කළ යුතුය. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන සංග්‍රහයට අනුකූල වීමට කටයුතු කළ යුතුය. |
| අංක IAI/2002/02 හා 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සඳහා වෙන් වෙන් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛණ පවත්වා නොතිබුණි.. | ස්ථාවර වත්කම් ලේඛණ වෙන වෙනම පවත්වාගැනීමට කටයුතු කළ යුතුය. | භාණ්ඩාගාර චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,409,514 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 4,637,623ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,047,137 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන රු. 47,993,000 න් ඉහළ යාම හා ගිවිසුම්ගත සේවා වියදම රු. 6,576,168 න් පහළයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

මෙම ආයතනයේ සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම හා වියදම ලෙස පුනරාවර්තන ප්‍රදාන හා සේවක පාරිශ්‍රමික පිළිවෙලින් රු.194,780,000 හා රු. 142,934,500 ක් ලෙස දැක්විය හැකි අතර එය ඉකුත් වර්ෂයේ රු.109,972,827 ක් හා රු.146,787,000 ක් සමග සැසඳීමේදී 33 % ක හා 30% ක වැඩිවීමකි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වානේ කැන්වස් ධාරකය(The Steel Easel Stand) යන උපකරණය දෘෂය හා තාක්ෂණික කලා සිසුන් විසින් චිත්‍ර ඇඳීම, පාට කිරීම හා චිත්‍ර ප්‍රදර්ශනය සඳහා භාවිතා කරන උපකරණයකි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකෙරේ.<br>(අ) වානේ ධාරක 36 කින් සිදුවූ රු. 88,804 ක පාඩුව අයකරගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.<br><br>(ආ) මුදල් රෙගුලාසි 104 හා 105 ප්‍රකාරව එම අලාභය සම්බන්ධයෙන් පිළිවෙලින් ලඟම ඇති පොලීසියට හෝ විගණකාධිපතිට වාර්තා කර නොතිබුණි.<br><br>(ඇ) තවද, මෙම ආධාරක මිලදී ගන්නා ලෙස සිසුන් විසින් ආචාර්යවරුන්ගෙන් ඉල්ලීම් කර ඇති බව අනාවරණය විය. සිසුන් විසින් තම අධ්‍යාන කටයුතු උදෙසා මෙම ආධාරකය මිලදී ගැනීම සඳහා රු.1,500 සට රු.4,000 ක පරාසයක මුදල් වියදම් කර තිබුණි. මෙම නැතිවීමේ ප්‍රතිඵලයක් ලෙස සිසුන් තම අධ්‍යාන කටයුතු වලදී විශාල අපහසුතාවයන්ට මුහුණ දී සිටී. | පිළිතුරු ලබා දී නොමැත. | දෙපාර්තමේන්තුව තුල විධිමත් තොග පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුවේ. අධ්‍යක්ෂකවරුන් විසින් පත්කරන ලද පරීක්ෂන තීරණ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) ජනාධිපති ලේකම්ගේ පිලිවෙලින් අංක. CSA/2/3/4 හා CSA/1/1/16 දරන 2006 පෙබරවාරි 26 හා 2012 ජුනි 11 දිනැති ලිපි ප්‍රකාරව, නිලධාරියකු රාජකාරී විදේශ සංචාරයක යෙදුනේනම් නැවත දිවයිනට පැමිණ සති 02 ක් තුල අදාල සංචාරය තුලින් ශ්‍රී ලංකා රජයට ලැබුණු පහසුකම්ද ඇතුලත්ව වාර්තාවක් ලබාදිය යුතු වේ. කෙසේවෙතත්, 2017 හා 2018 වර්ෂවලදී විශ්වවිද්‍යාල අරමුදල් භාවිතාකරමින් රු.4,873,402 ක් වියදම් දරා නිලධාරින් 02 ක් හා ආචාර්යවරුන් 05 ක් විදේශ සංචාරවල නිරත වී තිබුණද අදාල වාර්තාවන් මෙම වාර්තාවේ දිනය දක්වාම ඉදිරිපත් කර නොතිබුණි. | වාර්තා ලබා දෙන ලෙස ඉල්ලා අදාල නිලධාරීන්ට සිහිකැඳවීම් යවා තිබේ. | ජනාධිපති ලේකම්ගේ උපදෙස් අනුව ක්‍රියාකිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) තාවකාලික කථිකාචාරය තනතුරේ සිට සේවයෙන් ඉවත්වූ ආයතනයේ සේවකයින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු බැඳුම්කර වටිනාකම රු. 3,913,865 ක් වූ අතර එක් මියගිය සේවකයකුගෙන් අයවියයුතු මුදල ඔහුගේ ඇපකරුවන්ගෙන් හෝ අර්ථසාධක අරමුදලෙන් වසර 4 කට වැඩි කාලයක් අයකිරීමකර නොතිබුණි. | බැඳුම්කර කඩකිරීම සම්බන්ධයෙන් වන වගකීමෙන් නිදහස් කරන මෙන් ඉල්ලා සේවකයෙකුගෙන් ලද අභායාචනයක් තවමත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සලකාබලමින් සිටී. අදාල බැඳුම්කර වටිනාකම පියවීමට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයට ගෙන්වා ගැනීමට අවශ්‍ය සියළු ලිපිලේඛණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමුකර කිබේ. මෙම ශේෂය ලස පසු අදාල බැඳුම්කර වටිනාකම පියවීමට කටයුතු කරනු ලැබේ. | ඉවත්ව ගිය සේවකයින්ගේ බැඳුම්කර වටිනාකම ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් හෝ අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | ආයතනයක සිදුකරන පර්යේෂණ තුලින් එම ආයතනයේ මට්ටම ඉහළ යන අතර එය ආර්ථිකයට විශාල දායකත්වයක් සපයනු ලැබේ. අධ්‍යන කාර්යමණ්ඩලයේ 46 දෙනෙකු පර්යේෂණ දීමනා ලබාගෙන පර්යේෂණ සිදුකිරීමට සඳහා සුදුසුකම් සපුරා ඇති නමුත් මෙම ආධාර 2007 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ලබාගෙන නොමැති බව නිරීක්ෂණය විය. මෙය අධ්‍යාපනයේ හා ආරථිකයේ වර්ධනයට අහිතකර ලෙස බලවා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | අධ්‍යන කාර්යමණ්ඩලය පරයේෂණ ආධාර ලබාගෙන පර්යේෂණ සිදුකළ යුතු අතර එමගින් විශ්වවිද්‍යාලයේ මට්ටම උසස් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2015 නොවැම්බර් 17 දිනැති ආයතනික චක්‍රලේඛ අංක 15/2015 ප්‍රකාරව අභ්‍යන්තර ශිෂ්‍යයින් සඳහා පවත්වන විභාගවල ප්‍රතිඵල සති 03 ක් තුල නිකුත් කළ යුතුය. කෙසේවෙතත්, 2014/2015,2015/2016 සහ 2016/2017 යන අධ්‍යන වර්ෂවල අභ්‍යන්තර ශිෂ්‍යයන් සඳහා පවත්වන ලද විභාගයන් වල ප්‍රතිපල මාස 3 සිට 6 දක්වා ප්‍රමද කාලයකින් නිකුත් කර තිබුණි. මෙය අධ්‍යනය අවසන් කළ සිසුන්ගේ රැකියා අවස්ථාවන් සඳහා අහිතකර ලෙස බලපා තිබුණි. | අනාගතයේදී මාස 3ක් ඇතුලත ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කරනු ලැබේ. | විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා වන චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම අනුව, තෙවන වසර DTA 3123 වේදිකා ආලෝකකරණ විභාගය සඳහා අත්‍යවශය (නාට්‍ය හා රංග කලාව) ආලෝක පද්ධති මිලදී ගැනීමට 2018 සැප්තැම්බර් සිට දෙසැම්බර් අතර කාලය තුල සිදුකිරිමට වෙන්කර තිබුණි.නමුත් 2019 මාර්තු 01 දිනය දක්වාම මිලදී ගෙන නොතිබුණි. කෙසේවෙතත්, DTA 3123 වේදිකා ආලෝකකරණ විභාගය 2018 ජූලි මාසයේ පැවැත්වීමට කටයුතු යොදා තිබුණි. වේදිකා ආලෝකකරණ පද්ධතිය නොමැතිවීම හේතුවෙන් අදාල විභාගය මාස 3කට වඩා කල්දමන ලදී. නිලධාරීන්ගේ නෙසැලකිල්ල ශිෂ්‍යන්ගේ අධ්‍යන කටයුතු වලට දැඩි බලපෑමක් එල්ලකර ඇති බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත ස්ථිර අනධ්‍යන කාර්යමණ්ඩලය 81 ක් වූ අතර එදිනට සත්‍ය කාර්යමණ්ඩලය 44 ක් වීම නිසා පුරප්පාඩු 37 ක් පැවතුණි. මෙම පුරප්පුපාඩු ප්‍රමාණය අනුමත කාර්යමණ්ඩලයෙන් සියයට 45 ක් විය. මෙම තත්ත්වය ආයතනයේ පරිපාලන හා අධ්‍යන කටයුතු වලදී ඉතා දැඩිව බලපා තිබුණි. නමුත් වසර 3 ක් ගතවුවද එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අනුමත ස්ථිර කාර්යමණ්ඩලය මත පදනම්ව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ආයතනය විසින් 2018 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි අංක 01/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 වගන්තිය ප්‍රකාරව අනුමත හා සත්‍ය කාර්යමණ්ඩලය, අභ්‍යන්තර විගණන සැලැස්ම වැනි තොරතුරු ඇතුලත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය මත පදනම්ව ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කළ යුතුය. |
| (ii) 2017 හා 2018 වර්ෂයන් සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති වාර්තාව පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම ප්‍රගති වාර්තාව නොමැතිවීම නිසා ආයතනය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇති අරමුණු හා ඉලක්ක ලඟාකර තිබේද යන්න සහතික කිරීමට නොහැකි විය. එබැවින්, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම උපයෝජනය කිරීමෙන් ආයතනයේ ඵලදායිබාවය හා කාර්යක්ෂමතාවය ලඟකරගැනීම සම්බන්ධයෙන් මැනබැලීමට විගණනයට නොහැකි විය | පිළිතුරු ලබා දී නොමැත. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඇගයීමට සහ මැන බැලීමට ප්‍රගති වාර්තා නියමිත කාලය තුල ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක NP/SP/SDG/17 හා 2017 අගෝස්තු 14 දිනැති තිරසර සංවර්ධනය සම්බන්ධ ලිපිය හා එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සඳහා වන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව තම විෂය පථය යටතේ ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් සම්බන්ධව විශ්වවිද්‍යාලය දැනුවත් වී තිබුණි. කෙසේ වුවත් එම කාර්යයන් වලට අදාල තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගැනීමට හා එම ඉලක්ක ලඟාකරගැනීමේ උපායමාර්ග හා ඉලක්ක ලඟාකරගැනීම මැන බැලීමේ දර්ශක ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | තිරසර සංවර්ධන විෂය පථය යටතේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතුය. |